# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 27 දරන කෘෂිකර්ම රක්ෂණ පනත

[සහතිකය සටහන් කළේ 1973 ජූලි මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 ජූලි මස 27 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබා ගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 27 දරන කෘෂිකර්ම රක්ෂණ පනත

[සහතිකය සටහන් කළේ 1973 ජූලි මස 11 වන දින]

එල්.ඩී.—ඕ. 46/72.

**නිශ්චිත වගා සහ පශු සම්පත් රක්ෂණය කිරීමේ ව්‍යාපාරය කරගෙන යාමට කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටුවීම සඳහා ද 1961 අංක 13 දරන වගා රක්ෂණ පනත ඉවත් කිරීම සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිසත් ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 27 දරන කෘෂිකර්ම රක්ෂණ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක වන්නේ ය. — ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

## I වන කොටස

### කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය පිහිටුවීම

**2.** (1) මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ ද පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වන්නා වූ ද මණ්ඩලයක් පිහිටුවනු ලැබේ:— — මණ්ඩලය පිහිටුවීම සහ එහි සංයුතිය.

(අ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සභාපතිවරයා,

(ආ) කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යාංශයේ නිලධරයකු,

(ඇ) කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නිලධරයකු,

(ඈ) සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නිලධරයකු,

(ඉ) මහජන බැංකුවේ හෝ ලංකා බැංකුවේ හෝ අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබ ආණ්ඩුව අනුමත කරන යම් කිසි වෙනත් බැංකුවක හෝ එම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා විසින් නාම කරනු ලබන නිලධරයකු,

(ඊ) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නිලධරයකු,

(උ) වී අලෙවි මණ්ඩලයේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන වී අලෙවි මණ්ඩලයේ නිලධරයකු.

ශේ 21601—21,557 (73/4)

(2) (1) වන උපවගන්තියෙන් මණ්ඩලයට දෙන ලද නාමයෙන් මණ්ඩලය සංස්ථාවක් වන අතර එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතුය. එම නාමයෙන් මණ්ඩලය විසින් නඩු පැවරිය හැකිය. එම නාමයෙන් මණ්ඩලයට විරුද්ධ ව නඩු පවරනු ලැබිය හැකිය.

මණ්ඩලයේ සභාපතිවරයා සහාදිනු.

3. (1) මණ්ඩලයේ සභාපතිවරයා (2) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් ව තුන් අවුරුදු කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර නැවත පත්කරනු ලැබීමට සුදුසු විය යුතුය.

(2) මණ්ඩලයේ සභාපතිවරයා ධුරයෙන් ඉවත් කිරීම අවශ්‍යානුකූල යයි අමාත්‍යවරයා අදහස් කළහොත් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර එම ඉවත් කිරීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතුය.

(3) කිසියම් හේතුවක් නිසා තම ධුරයේ යුතුකම් ඉටුකිරීමට සභාපතිවරයා තාවකාලික ව අපොහොසත් වුවහොත් ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට සුදුසු තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

(4) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයකින් හා ප්‍රමාණ අනුව මණ්ඩලයේ සභාපතිවරයාට පාරිශ්‍රමික ගෙවිය යුතු අතර එපරිද්දෙන් ම නිශ්චය කරනු ලබන සේවා කොන්දේසිවලට ඔහු යටත් විය යුතුය.

(5) අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියකින් මණ්ඩලයේ සභාපතිවරයාට තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(6) මණ්ඩලයේ රැස්වීම් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුතු අතර ඉහත සඳහන් අන්දමට යටත් ව මණ්ඩලය විසින් මණ්ඩලයේ කාර්ය පරිපාටිය විධිමත් කළ හැකිය.

(7) මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් ඇත ද මණ්ඩලයට ක්‍රියා කළ හැකිය.

මණ්ඩලයේ පොදු පාලනය.

4. මණ්ඩලයේ කටයුතු සහ ව්‍යාපාරය පිළිබඳ පොදු අනුපාලනය, පාලනය සහ පරිපාලනය මණ්ඩලයේ සාමාජිකයන් සතු වන්නේ ය.

මණ්ඩලයේ මුද්‍රාව.

5. (1) මණ්ඩලයේ මුද්‍රාව මණ්ඩලය භාරයෙහි තිබිය යුතුය.

(2) මණ්ඩලයේ මුද්‍රාව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට වෙනස් කරනු ලැබිය හැකිය.

(3) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට මණ්ඩලයේ මුද්‍රාව නොතැබිය යුතු අතර ඒ සාමාජිකයන් දෙදෙනා තමන් සිටි බවට ලකුණු වශයෙන් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතුය.

6. මණ්ඩලයේ යුතුකම් ඉටුකිරීම ද බලතල ක්‍රියාවෙහි යෙදවීම ද පිළිබඳ ව අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් පොදු හෝ විශේෂ විධාන කළ හැකි අතර මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුතුය.

මණ්ඩලය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ බලතල.

7. (1) මණ්ඩලයේ කටයුතු කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් හා සේවකයන් මණ්ඩලයේ කාර්ය මණ්ඩල යට පත් කිරීම මණ්ඩලය විසින් කළ හැකිය.

මණ්ඩලයේ කාර්ය මණ්ඩල.

(2) මණ්ඩලයේ ඉල්ලීම පිට රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිල ධරයකු ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂය පවරනු ලැබ සිටින අමාත්‍යාංශයේ ලේකම්ගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කළ හැකි කාලසීමාවක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලික ව පත් කරනු ලැබිය හැකිය. නැතහොත් මණ්ඩලයේ ඉල්ලීම පිට රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු ඒ නිලධරයාගේ හා එකී ලේකම්ගේ කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිර ව පත් කරනු ලැබිය හැකිය.

(3) රාජ්‍ය සේවයෙහි නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලික ව පත් කරනු ලැබූ අවස්ථාවක, 1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනතේ 9 වන වගන්තියේ (2) වන උපවගන්තිය අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව ඔහු කෙරෙහි ද ඔහු සම්බන්ධයෙන් ද අදාළ වන්නේය.

(4) රාජ්‍ය සේවයෙහි නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිර ව පත් කරනු ලැබූ අවස්ථාවක, 1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව ඔහු කෙරෙහි ද ඔහු සම්බන්ධයෙන් ද අදාළ වන්නේය.

(5) ආණ්ඩුව සමග නිශ්චිත කාලයක් සඳහා වූ ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මණ්ඩලයට සේවය කරනු ලබන යම් කාලයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවය ලෙස සලකනු ලැබිය යුතුය.

(6) මණ්ඩලයේ සියලු නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූල ව සහ එහි කාර්යයන් සඳහා රාජ්‍ය නිලධර යන් ලෙස සලකනු ලැබිය යුතුය.

8. මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූල උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම පනතේ විධි විධාන ඒ අනුව තේරුම් ගත යුතුය.

මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූල උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන බව.

මණ්ඩලයේ සාමාන්‍ය පරමාර්ථ.

9. පහත සඳහන් පරමාර්ථ, එනම් :—

(අ) වී වගාව ද ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයකින් අමාත්‍යවරයා විසින් නිශ්චය කර දක්වනු ලබන (මෙහි මින්මතු " නිශ්චිත වගා " යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් වගා ද සම්බන්ධයෙන් හා පශු සම්පත් සම්බන්ධයෙන්, ගොවීන්ගේ යහපත පිණිස, ඔවුන්ට සිදුවන පාඩුවල දී වන්දි ගෙවන්නා වූ හා ගොවිපළවල ආදායම් ස්ථාවර කිරීමේ බලපෑමක් හා කෘෂි ද්‍රව්‍ය නිෂ්පාදනයේ වැඩිදියුණුව සැලැස්වීමක් ඇති කර ගන්නා වූ සර්වග්‍රාහී කෘෂිකර්ම රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම ; හා

(ආ) එම කෘෂිකර්ම රක්ෂණයේ වැඩිදියුණුවට හා සංවර්ධනයට අවශ්‍ය පර්යේෂණ කටයුතු කිරීම

මණ්ඩලයේ සාමාන්‍ය පරමාර්ථ වන්නේ ය.

මණ්ඩලයේ බලතල.

10. (1) පහත සඳහන් බලතල සියල්ල ම හෝ ඉන් යමක් මණ්ඩලය විසින් ක්‍රියාවෙහි යෙදවිය හැකිය :—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, සතුව සිටීම, බද්දට හෝ කුලියට ගැනීම, උකස් කිරීම, විකිණීම හෝ අන් ආකාරයකින් බැහැර කිරීම ;

(ආ) කෘෂිකර්ම රක්ෂණ ව්‍යාපාරයේ සියලු ම අංශ සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම, ඊට සහාය වීම සහ ධෛර්ය දීම ;

(ඇ) මණ්ඩලයෙහි යුතුකම් ඉටුකිරීම සහ බලතල ක්‍රියාවෙහි යෙදවීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම් මණ්ඩලය විසින් ම හෝ ඒ සඳහා බලය පවරනු ලැබූ නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් ඇතිකර ගැනීම හා ඒ ගිවිසුම් ඉටු කිරීම ;

(ඈ) මණ්ඩලය විසින් සේවයෙහි යොදවා ගනු ලබන තැනැත්තන්ගේ දක්ෂතාව දියුණු කිරීමේ කාර්යය සඳහා කවර දෙයක් වුව ද කිරීම සහ මණ්ඩලයේ වැඩ කටයුතු කර ගෙන යාමට අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීමේ පහසුකම් සැලැස්වීම ;

(ඉ) මණ්ඩලයේ ව්‍යාපාරය කාර්යක්ෂම ලෙස කර ගෙන යාම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන කාර්යයන් ඉටු කිරීමට මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ නිලධරයකුට හෝ යම් රාජ්‍ය නිලධරයකුට බලය පැවරීම ;

(ඊ) මණ්ඩලයේ නිලධරයන් හා සේවකයන් පත්කිරීම, උසස් කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන්ගේ විනය පාලනය, පැවැත්ම හා ඔවුන්ට නිවාඩු දීම ඇතුළු ව ඔවුන් සම්බන්ධයෙන් රීති සෑදීම ;

(උ) මණ්ඩලයේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාම සඳහා ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක්, 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදා වර්ධන පනත යටතේ පිහිටුවනු ලැබූ කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවක් හෝ ඒ කමිටුවේ යම් අනුයෝජිතයකු හෝ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ පිහිටුවනු ලැබූ යම් සමුපකාර සමිතියක් සමග හවුල් යෝජනා ක්‍රමවලට ඇතුළත් වීම ;

(ඌ) මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ;

(එ) මණ්ඩලයේ කටයුතු නිසි ලෙස කර ගෙන යාම පහසුවීමට අවශ්‍ය යයි මණ්ඩලය අදහස් කරන වෙනත් සියලු දේ කිරීම.

(2) මේ වගන්තියෙහි ඉහත දැක්වුණු විධිවිධානවලින් මණ්ඩලය වෙත පැවරුණු හෝ නියම වුණු බලතල හා යුතුකම් කාර්යක්ෂම ලෙස ක්‍රියාවෙහි යෙදවීමට හා ඉටු කිරීමට සම්බන්ධ යම් කාර්යයක් සඳහා එකී විධිවිධානවල සඳහන් නො වූ යම් ව්‍යවසායක් හෝ ව්‍යාපාරයක් කර ගෙන යාමට හෝ එවැනි යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීමට මණ්ඩලයට බලය පැවරීම අවස්ථානුකූල බවට අමාත්‍යවරයා සෑහීමට පත් වුවහොත්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, ඒ නියමයෙහි සඳහන් කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත් ව මණ්ඩලයට ඒ බලය පැවරිය හැකිය.

(3) (2) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ සෑම නියමයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතිය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියමයක් එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව එහි අනනුමතියේ දිනයේ සිට ප්‍රත්‍යාදිෂ්ට වූ ලෙස සැලකිය යුතුය. එසේ ප්‍රත්‍යාදිෂ්ට නොවන සෑම නියමයක් ම මෙහි ලා පනවනු ලැබුවාක් මෙන් වලංගු ව බල පැවැත් විය යුතුය.

(4) තත් කාලයෙහි වලංගු යම් නීතියක් මණ්ඩලය විසින් නො සලකනු ලැබීමට මේ වගන්තියෙහි ඉහත දැක්වුණු විධිවිධානවල කිසිවකින් බලය පැවරෙන ලෙස තේරුම් නොගත යුතුය.

## II වන කොටස

### වී වගා අනිවාර්ය රක්ෂණය

වී වගා අනිවාර්ය රක්ෂණය කිරීම.

11. (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍ය වරයා විසින් මේ පනතේ මේ කොටසේ කාර්යයන් සඳහා කලින් කල නිශ්චය කරනු ලබන යම් ප්‍රදේශයක වී වගාවෙහි ලා වූ සම්බන්ධතාවක් ඇති සෑම තැනැත්තකු ම ඒ නියමයෙහි සඳහන් (මෙහි මින් මතු "නිශ්චිත හේතුව" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් හේතුවක් කරණකොට ගෙන ඒ වගාව විනාශ වීමට ආරක්ෂණ වශයෙන් ඒ නියමයෙහි සඳහන් දිනයක සිට මණ්ඩලය සමග රක්ෂණ ගිවිසුමකට ඇතුලත් වූ ලෙස මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත් ව සලකනු ලැබිය යුතුය.

(2) (1) වන උපවගන්තියේ කාර්යයන් සඳහා වී වගාවෙහි ලා වූ සම්බන්ධතාවක් ඇති තැනැත්තකු යන්නෙන් ඉඩම් හිමි ගොවියකු, අඳය ගොවියකු, අඳය ගොවියන් සහිත ඉඩම් හිමියකු සහ කෘෂිකාර්මික කම්කරුවන් සහිත ඉඩම් හිමියකු අදහස් වන අතර රක්ෂණ ගිවිසුමකට ඇතුළත් වූ ලෙස (1) වන උපවගන්තිය යටතේ සලකනු ලබන යම් තැනැත්තෙක් "රක්ෂිත තැනැත්තෙක්" යනුවෙන් මෙහි මින් මතු සඳහන් කරනු ලැබේ.

මේ උපවගන්තියෙහි "ඉඩම් හිමි ගොවියා", "අඳය ගොවියා", "ඉඩම් හිමියා" සහ "කෘෂිකාර්මික කම්කරුවෝ" යන යෙදුම්වල 1958 අංක 1 දරන කුඹුරු පනතෙහි ඒ යෙදුම් සඳහා පිළිවෙලින් දී ඇති අර්ථ ම ඇත්තේ ය.

(3) වී වගාව විනාශ වීමේ අනතුර ඉතා අධිකයැයි සලකනු ලබන ප්‍රදේශයක් හෝ ඉඩම් ප්‍රමාණයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව, මණ්ඩලය විසින් මේ වගන්තියේ විධිවිධානවලින් බැහැර කළ හැකිය.

වාරිකය නිශ්චය කිරීම සහ ගෙවීම.

12. (1) රක්ෂිත තැනැත්තන් විසින් ගෙවිය යුතු වාරික මුදල මණ්ඩලය විසින් නිශ්චය කළ යුතු අතර මණ්ඩලය විසින් එය කලින් කල වෙනස් කළ හැකිය.

(2) රක්ෂිත තැනැත්තන් දෙදෙනකුට හෝ ඊට වැඩි සංඛ්‍යාවකට වී වගාවෙහි කොටස් තිබෙන අවස්ථාවක, ඒ එක් එක් රක්ෂිත තැනැත්තා විසින් ගෙවිය යුතු වාරිකය ඒ එක් එක් රක්ෂිත තැනැත්තාට හිමි කොටස ගැන සැලකිලිමත් ව මණ්ඩලයේ සභාපති විසින් නිරණය කළ යුතුය.

(3) ඒ වාරිකය මුදලින් හෝ වාරිකයේ මුදලට සමාන වටිනාකමක් ඇති වී ප්‍රමාණයකින් ගෙවනු ලැබිය හැකිය. සහතික මිල ක්‍රමය ඒ වගාවට අදාළ වන්නේ නම් ඒ ක්‍රමය යටතේ තත් කාලයෙහි පවත්නා වී මිල අනුව ඒ වටිනාකම ගණන් බැලිය යුතුය. සහතික මිල ක්‍රමය ඒ වගාවට අදාළ නොවන්නේ නම්

වාරිකය ගෙවිය යුතු අවුරුද්දට පෙරාතුව, ම වූ අවුරුදු තුන ඇතුළත වූ, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන, ඒ වගාවේ සාමාන්‍ය වෙළඳ මිල අනුව ඒ වටිනාකම ගණන් බැලිය යුතුය.

(4) සහතික මිල ක්‍රමය වී වගාවට අදාළ වන අවස්ථාවක, වී අලෙවි මණ්ඩලය විසින් හෝ එහි බලයලත් ගැනුම්කරුවන් විසින් හෝ ඒ මිල ක්‍රමය යටතේ රක්ෂිත තැනැත්තාගෙන් මිලට ගත් යම් වී ප්‍රමාණයක මිල වශයෙන් ඔහුට ගෙවිය යුතු මුදලින්, මේ පනත යටතේ රක්ෂිත තැනැත්තා විසින් කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයට ගෙවිය යුතු වාරික මුදල කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයේ ඉල්ලීම පිට අවස්ථාවෝචිත පරිදි වී අලෙවි මණ්ඩලය විසින් හෝ එහි බලයලත් ගැනුම්කරුවන් විසින් හෝ අඩු කරනු ලැබීම නීත්‍යනුකූල වන්නේය.

(5) සම්පූර්ණ වාරිකයක් ලෙස හෝ වාරිකයක කොටසක් ලෙස හෝ යම් මුදලක් ගෙවීමට යටත් රක්ෂිත තැනැත්තකු මණ්ඩලය විසින් ඉඩ දෙනු ලැබ ඇති කාලය ඇතුළත ඒ මුදල ගෙවීම පැහැර හැරිය හොත්, ඒ මුදල; ගෙවීම පැහැර හැර තිබෙන මුදලක් ලෙස සලකනු ලැබිය යුතුය. තවද අධිකරණය වෙත ඉල්ලුම් කිරීමට මණ්ඩලය විසින් බලය පවරන ලද නිලධරයකු විසින්, වාරිකය ගෙවීම පැහැර හරිනු ලැබ ඇත්තේ යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් ද එය පිහිටා ඇති ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති ගම්බද අධිකරණය වෙත හෝ ඒ ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති ගම්බද අධිකරණයක් නොමැති අවස්ථාවක ඒ ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයකින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයක් අනුව ගණන් බලන ලද පොළිය වශයෙන් වූ අතිරේක මුදලකුත් සමග, එම අධිකරණය විසින් නියම කරන ලද දඩයක් අය කර ගන්නා ආකාරයෙන් එම මුදල අය කර ගත යුතුය. එසේ අය කර ගැනීමේ කාර්යය සඳහා, වාරිකය ගෙවිය යුතුව ඇත්තේ යම් ඉඩම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් ද ඒ ඉඩම් ප්‍රමාණයේ පලදාව තහනමට ගෙන විකිණීමට යටත් විය යුතුය.

(6) සහතිකයෙහි සඳහන් මුදල රක්ෂිත තැනැත්තාගෙන් මණ්ඩලයට අය විය යුතු බවට, මණ්ඩලය විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ නිලධරයකුගේ අත්සන යටතේ වූ සහතිකයක්, එම මුදල එම තැනැත්තාගෙන් මණ්ඩලය වෙත ලැබිය යුතු බවට (5) වන උපවගන්තියේ කාර්යයන් සඳහා තීරණාත්මක සාක්ෂියක් වන්නේය.

වගාව විනාශවීම සම්බන්ධයෙන් වන්දි ඉල්ලීම.

**13.** යම් නිශ්චිත හේතුවක් නිසා ඉඩම් ප්‍රමාණයක වී වගාව විනාශ වූ අවස්ථාවක රක්ෂිත තැනැත්තා විසින් ඒ ඉඩම් ප්‍රමාණය පිහිටා තිබෙන ප්‍රදේශය තුළ බලය ඇත්තා වූ ද මණ්ඩලය විසින් පත් කරනු ලැබුවා වූ ද අනුයෝජිතයා වෙත ඒ විනාශය සිදු වූ දින සිට දින හතක් ඇතුළත ඒ විනාශවීම සම්බන්ධයෙන් වන්දි ඉල්ලීමක් ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතුය.

මන්දි ප්‍රදානය කිරීම.

**14.** (1) වී වගාව විනාශවීම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදලේ ප්‍රමාණය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නියමයන් සහ කොන්දේසි අනුව ගණන් බැලිය යුතුය.

(2) වාරිකය ගෙවීමේ කාර්යය සඳහා රක්ෂිත තැනැත්තකුට ණය දුන් පිළිගත් ණය නියෝජිත ආයතනයකට ලැබිය යුතු මුදලක් ඒ රක්ෂිත තැනැත්තාට ගෙවිය යුතු වන්දි මුදලෙන් අඩු කරනු ලැබිය හැකිය.

වන්දි ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අභියාචනා කිරීම ආදිය.

**15.** (1) රක්ෂිත තැනැත්තකු විසින් කරනු ලැබූ වන්දි ඉල්ලීමක් මණ්ඩලය විසින් බලය පවරනු ලැබූ නිලධරයකු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක හෝ එකී යම් නිලධරයකු විසින් රක්ෂිත තැනැත්තකුට ප්‍රදානය කරන ලද වන්දි ප්‍රමාණය ගැන ඒ රක්ෂිත තැනැත්තා සෑහීමට පත් නොවූ අවස්ථාවක ඒ රක්ෂිත තැනැත්තා විසින් අවස්ථාවෝචිත පරිදි වන්දිය ප්‍රතික්ෂේප කිරීම හෝ එය ප්‍රදානය කිරීම තමාට නිවේදනය කරනු ලැබූ දින සිට මාසයක් ඇතුළත, අභියාචනයේ හේතු ද දක්වමින් ලිඛිත අභියාචනයක් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ හැකිය.

(2) මේ වගන්තිය යටතේ යම් අභියාචනයක් සම්බන්ධයෙන් මණ්ඩලයේ තීරණය අවසානාත්මක සහ තීරණාත්මක විය යුතු අතර කිසිම අධිකරණයක දී එය ප්‍රශ්න නොකළ යුතුය.

උපරිම රක්ෂණ වගකීම.

**16.** (1) මේ පනතේ මේ කොටසේ කාර්යයන් සඳහා යම් කන්නයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල සම්පූර්ණ රක්ෂණ වගකීමෙන් සියයට පහළොවකට වැඩි නොවන අවස්ථාවක දී ඒ මුදල කෘෂිකර්ම රක්ෂණ අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

ඒ මුදල ඉහත කී සියයට පහළොවට වැඩි වන අවස්ථාවක දී, ඒ මුදලේ සියයට පහළොවකට සමාන කොටස කෘෂිකර්ම රක්ෂණ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර ඉතිරි කොටස ආණ්ඩුව විසින් තත් කාර්යය සඳහා ප්‍රතිපාදනය කරනු ලැබ ඇති මුදල්වලින් ගෙවනු ලැබිය යුතුය.

(2) මේ වගන්තියේ "සම්පූර්ණ රක්ෂණ වගකීම" යන්නෙන් යම් වගා කන්නයක දී වී ගොවිතැන් කරන ලද රක්ෂිත මුළු ඉඩම් අක්කර ප්‍රමාණය ගෙවිය යුතු උපරිම වන්දියෙන් වැඩි කරන ලද විට ලැබෙන ප්‍රමාණය අදහස් වේ.

## III වන කොටස

### වෙනත් වගා සහ පශු සම්පත් ස්වේච්ඡා රක්ෂණය

ස්වේච්ඡා රක්ෂණය කළ යුතු වගා සහ පශු සම්පත් වර්ග අමාත්‍යවරයා විසින් නිශ්චය කළ යුතු බව.

**17.** මණ්ඩලය විසින් ස්වේච්ඡා රක්ෂණ පහසුව සැලැස්විය යුතු වගාව හෝ වගා ද පශු සම්පත් වර්ග ද ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් කලින් කල නිශ්චය කළ හැකිය.

18. මේ පනතේ මේ කොටස යටතේ යම් වගාවක් හෝ පශු සම්පත් වර්ගයක් රක්ෂණය කිරීම සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තකුට ම,— රක්ෂණ ඔප්පුව.

(අ) රක්ෂිත තැනැත්තාගේ නම;

(ආ) රක්ෂණයට විෂය වූ දෙය;

(ඇ) රක්ෂිත මුදල;

(ඈ) ආරක්ෂිත කාල සීමාව;

(ඉ) රක්ෂිත විනාශ හේතු; සහ

(ඊ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන නියම, ව්‍යතිරේක, කොන්දේසි හා පිටසන් කිරීම්

යන මේ විස්තර ඇතුළත් රක්ෂිත ඔප්පුවක් නියම කරනු ලැබිය හැකි නියමවලට හා කොන්දේසිවලට යටත් ව මණ්ඩලය විසින් නිකුත් කළ යුතුය.

19. මේ පනතේ මේ කොටසේ කාර්යයන් සඳහා ආණ්ඩුව සමග හෝ පුනර් රක්ෂණ ව්‍යාපාරයේ යෙදෙන යම් දේශීය හෝ විදේශීය ආයතනයක් සමග හෝ අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව මණ්ඩලයට පුනර් රක්ෂණ ගිවිසුමකට ඇතුළත් විය හැකිය. පුනර් රක්ෂණය.

## IV වන කොටස

## මුදල් කටයුතු

20. (1) මණ්ඩලයේ මූලික ප්‍රාග්ධනය රුපියල් විසි ලක්ෂයක් විය යුතුය. මණ්ඩලයේ ප්‍රාග්ධනය.

(2) මණ්ඩලයේ මූලික ප්‍රාග්ධනය මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයකින් කලින් කල වැඩි කරනු ලැබිය හැකිය.

(3) මණ්ඩලයේ මූලික ප්‍රාග්ධන මුදල සහ (2) වන උපවගන්තියේ සඳහන් පරිදි ඒ ප්‍රාග්ධනයෙහි යම් වැඩි කිරීමක් කරන ලද නම් ඒ වැඩි කරන ලද මුදල අමාත්‍යවරයා විමසා මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන කොටස්වලින් ඒකාබද්ධ අරමුදලෙන් මණ්ඩලයට ගෙවනු ලැබිය යුතුය.

(4) මණ්ඩලයේ මූලික ප්‍රාග්ධනය සඳහා හෝ වැඩි වූ ප්‍රමාණය සඳහා ඒකාබද්ධ අරමුදලෙන් ගෙවීමක් කරනු ලැබීමෙන් පසු හැකි තාක් ඉක්මනින් මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් ඒ ගෙවීම පිළිබඳ ප්‍රකාශයක් ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

21. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) කෘෂිකර්ම රක්ෂණ අරමුදලක් පිහිටුවනු ලැබේ. මණ්ඩලයේ අරමුදල.

(2) එම අරමුදලට පහත සඳහන් මුදල් ගෙවිය යුතුය:—

(අ) මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා ජාතික රාජ්‍ය සභාව විසින් කලින් කල වෙන් කරනු ලබන සියලු මුදල්;

(ආ) මේ පනත යටතේ මණ්ඩලයේ බලතල ක්‍රියාවෙහි යෙදවීමෙහි ලා, කාර්යයන් කිරීමෙහි ලා සහ යුතුකම් ඉටු කිරීමෙහි ලා මණ්ඩලයට ලැබෙන සියලු මුදල් ;

(ඇ) 1961 අංක 13 දරන වගා රක්ෂණ පනත යටතේ පිහිටුවන ලද රක්ෂණ අරමුදලේ බැරට තිබෙන සියලු මුදල්.

(3) මේ පනත යටතේ මණ්ඩලයේ බලතල ක්‍රියාවෙහි යෙදවීමෙහි ලා, කාර්යයන් කිරීමෙහි ලා සහ යුතුකම් ඉටුකිරීමෙහි ලා මණ්ඩලය විසින් දරනු ලබන යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සහ ඒ අරමුදලෙන් ගෙවන ලෙස මේ පනත යටතේ හෝ මේ පනතින් නියම කර ඇති සියලු මුදල් ඒ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතුය.

පරිපාලන වියදම.

22. මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික සහ දීමනා ද මේ පනත ක්‍රියාත්මක කිරීමෙහි ලා දරනු ලබන වෙනත් සියලු වියදම් ද ඒවා ගෙවීම පිණිස ජාතික රාජ්‍ය සභාව විසින් ප්‍රතිපාදනය කරනු ලැබ ඇති මුදල්වලින් ගෙවනු ලැබිය යුතුය.

මණ්ඩලය සතු ණයට ගැනීමේ බලතල.

23. (1) මණ්ඩලයේ බැඳීම් ඉටුකිරීම සඳහා හෝ මණ්ඩලයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා හෝ මණ්ඩලයට අවශ්‍ය විය හැකි මුදල්, අමාත්‍යවරයා හා මුදල් විෂය භාර අමාත්‍යවරයා යන දෙදෙනාගේ ම එකඟත්වය ඇතිව, හෝ එසේම වූ එකඟත්වය ඇතිව දෙන ලද යම් පොදු බලයක නියමයන් අනුව, අයිරා අණකර මාර්ගයෙන් හෝ අන්‍යාකාරයකින් මණ්ඩලය විසින් ණයට ගැනීම හෝ ගිවිස ගෙන ණය වශයෙන් ලබා ගැනීම කළ හැකිය :

එසේ වුව ද මේ උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් ලබා ගන්නා ලද ණය කිසිවක් වෙනුවෙන් ගෙවීමට හිඟ තිබිය හැකි මුදල්වල මුළු එකතුව, කිසිම විටෙක, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන මුදලකට වැඩි නොවිය යුතුය.

(2) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ලබා අමාත්‍යවරයා විසින් දෙනු ලබන කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් පහත සඳහන් කාර්යයන් සියල්ල හෝ ඉන් යමක් සඳහා (1) වන උපවගන්තිය යටතේ ණය මුදලක් වශයෙන් නොව අන්‍යාකාරයකින් මුදල් ණයට ගනු ලැබිය හැකිය :—

(අ) මණ්ඩලයේ ව්‍යාපාරය සඳහා අවශ්‍ය යම් චංචල හෝ නිශ්චල හෝ දේපළක් බලකර ලබා ගැනීම හෝ අත්කර ගැනීම;

(ආ) (1) වන උපවගන්තිය යටතේ ණයට ගනු ලැබූ යම් මුදලක් ආපසු ගෙවීම.

මණ්ඩලයේ මුදල් ආයෝජනය කිරීම.

24. මණ්ඩලයේ ව්‍යාපාරයෙහි කාර්යය සඳහා වහා අවශ්‍ය නොවන මණ්ඩලයේ යම් මුදලක්, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි කෘෂිකර්ම සංවර්ධනයට සම්බන්ධ යම් කාර්යයක් සඳහා මණ්ඩලය විසින් යොදවනු ලැබිය හැකිය.

25. 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව මණ්ඩලයේ මුදල් පාලනයට සහ ගණන්වලට අදාළ විය යුතුය.

1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අදාළ වීම.

## V වන කොටස

### පොදු විධිවිධාන

26. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

නියෝග.

(2) විශේෂයෙන් වුව ද (1) වන උපවගන්තියෙන් පවරන ලද බලතලවල ව්‍යාප්තියට හානියක් නොවන පරිදි, නියම කිරීමට මේ පනතින් ප්‍රකාශිත හෝ නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් නියමිත සියලු කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එය එසේ පළ කරනු ලබන දින යෙහි හෝ නියෝගයේ සඳහන් කරනු ලැබිය හැකි ඊට පසු දිනයක එය ක්‍රියාත්මක විය යුතුය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතිය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැති ව එහි අනනුමතියේ දිනයෙහි සිට පරිච්ඡින්න වූ ලෙස සැලකිය යුතුය. නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

27. (1) (අ) මණ්ඩලය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සඳහා මණ්ඩලයට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ මෙහෙයවීම පිට හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධ ව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොවිය යුතුය.

මේ පනත යටතේ හෝ මණ්ඩලයේ මෙහෙයවීම පිට කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව සැලසීම.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ මෙහෙයවීම පිට හෝ කරනු ලැබූ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක ඔහුට විරුද්ධ ව පවරන ලද යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දක් බව අධිකරණය පිළිගන්නහොත් මණ්ඩලයේ මුදලින් ගෙවිය යුතුය.

වැරදි.

**28.** (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ මේ පනත යටතේ නීත්‍යනුකූල ව දෙනු ලබන යම් නියමයක් හෝ විධානයක් කඩ කරන හෝ ඒ අනුව ක්‍රියාකිරීම පැහැර හරින සෑම තැනැත්තෙක් ම මේ පනත යටතේ වරදක් කරන්නේ ය.

(2) මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තකු ම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට එක් අවුරුද්දක්ට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකට ම යටත් විය යුතුය.

(3) අපරාධ නඩු විධාන සංග්‍රහයේ පළමුවන උපලේඛනයෙහි පටහැනි ව කුමක් සඳහන්ව ඇත ද මේ පනත යටතේ සෑම වරදක් ම ඒ නීති සංග්‍රහයේ අර්ථානුකූල සංඥේය වරදක් වන්නේ ය.

(4) මේ පනත යටතේ වරදක් සංස්ථාවක් විසින් කරන ලද අවස්ථාවක තමාගේ කැමැත්ත නො වරදෙහි ලා නිසොල්මන් වීම නොමැති ව ඒ වරද කර ඇති බවත් එළඹ තිබුණු කරුණු අනුව වරදෙහි ස්වභාවය ගැන සැලකිලිමත් ව තමා විසින් කළ යුතුව තිබූ පරිදි ඒ වරද කිරීම වැළැක්වීමට තමා සියලු උද්‍යෝගයෙන් ක්‍රියා කළ බවත් ඔප්පු කරතහොත් මිස ඒ වරද කරනු ලැබූ අවස්ථාවේ සංස්ථාවේ සාමාජිකයකු, සාමාන්‍යාධිකාරි, ලේකම් හෝ එවැනි වෙනත් නිලධරයකු ව සිටි සෑම තැනැත්තකු ම ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතුය.

මේ පනත වෙනත් ලිඛිත නීති අභිභවා බලපැවැත්විය යුතු බව.

**29.** අන් කිසි ලිඛිත නීතියක පටහැනි ව කුමක් සඳහන් ව ඇත ද මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර, ඒ අනුව, මේ පනතේ විධිවිධාන හා ඒ අන් නීතිය අතර යම් ගැටුමක් හෝ නොගැළපීමක් ඇති වූ අවස්ථාවක මේ පනතේ විධිවිධාන ඒ අන් නීතිය අභිභවා බලපැවැත්විය යුතුය.

ජනරජයේ නිශ්චල සහ චංචල යන දෙවර්ගයේ ම දේපළ මණ්ඩලයට ලබා දියයුතු බව සහ මණ්ඩලය සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම.

**30.** (1) මණ්ඩලයේ ව්‍යාපාරයෙහි කාර්යය සඳහා ජනරජයේ යම් නිශ්චල දේපළක් අවශ්‍ය වූ අවස්ථාවක, ඒ කාර්යය රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ පිළිබඳ විශේෂ ප්‍රදානයක් කළ හැකි හෝ බද්දක් දිය හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ ආඥාපනතේ විධිවිධාන මණ්ඩලය වෙත ඒ දේපළ පිළිබඳ ව කරනු ලබන විශේෂ ප්‍රදානයකට හෝ දෙනු ලබන විශේෂ බද්දකට අදාළ විය යුතුය.

(2) මණ්ඩලයේ ව්‍යාපාරයෙහි කාර්යය සඳහා ජනරජයේ යම් චංචල දේපළක් අවශ්‍ය වූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඒ චංචල දේපළෙහි සන්තකය සහ පරිහරණය මණ්ඩලය වෙත පවරා සතු කර දෙනු ලැබිය හැකිය.

(3) මණ්ඩලයේ ව්‍යාපාරයෙහි කාර්යය සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම අවශ්‍ය වන්නා වූ ද අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමකින් යෝජිත අත්කර ගැනීම අනුමත කරනු ලබන්නා වූ ද අවස්ථාවක ඒ දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍ය ව ඇති ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අනිවාර්යයෙන් ම අත්කර ගෙන මණ්ඩලය වෙත පැවරිය යුතුය.

(4) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ මණ්ඩලය සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් මුදලක්, මණ්ඩලය විසින් ගෙවිය යුතුය.

**31.** මේ පනත යටතේ වූ යම් වන්දියක් ගෙවනු ලැබිය යුතු යම් තැනැත්තකු ඒ වන්දිය ලැබීමට පෙර මිය ගිය අවස්ථාවක, ඊට හිමිකම් ඇති තැනැත්තන් විසින් එම වන්දිය ලබා ගැනීම පිණිස, එය රුපියල් හත්සිය පණහකට වැඩිවීම හෝ වැඩි නොවීම අනුව, වන්දිය අදාළ ඉඩම සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටා ඇත්තේ යම් දිසා අධිකරණයක හෝ රික්වෙස්ට් අධිකරණයක අධිකරණ බල සීමා තුළ ද ඒ දිසා අධිකරණයට, නැතහොත් ඒ රික්වෙස්ට් අධිකරණයට මණ්ඩලය විසින් ඒ වන්දි මුදල ගෙවිය යුතුය.

වන්දියකට හිමිකම ඇති තැනැත්තකු මිය ගිය විට වන්දි ගෙවීම.

**32.** මේ පනත යටතේ නිකුත් කරනු ලැබූ ඔප්පුවක් අදාළ වන ඉඩම් ප්‍රමාණයක යම් නිශ්චිත වගාවක් වගා කිරීමට සම්බන්ධ යම් කාර්යයක් සඳහා ඒ රක්ෂණ ඔප්පුවේ හිමියාට හෝ හිමියන්ට පිළිගත් ණය නියෝජිත ආයතනයක් විසින් දෙනු ලබන ණයක් වෙනුවෙන් ඇපයක් වශයෙන් ඒ රක්ෂණ ඔප්පුව ඒ රක්ෂණ ඔප්පුවේ හිමියා හෝ හිමියන් විසින් ඒ ආයතනය වෙත පැවරිය හැකිය.

ණය සඳහා ඇප වශයෙන් රක්ෂණ ඔප්පුව පැවරීම.

**33.** මේ පනත යටතේ වන්දි වශයෙන් යම් තැනැත්තකුට ලැබිය යුතු කිසිම මුදලක්, වෙන යම් ලිඛිත නීතියක පටගැනී ව කුමක් සඳහන් ව ඇත ද, ජනරජයට හෝ යම් පිළිගත් ණය නියෝජිත ආයතනයකට යම් මුදලක් ගෙවීම සඳහා වූ තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් නොවන යම් අධිකරණයක තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් ක්‍රියාවෙහි යෙදවීමෙහි ලා තහනමට ගැනීම හෝ තහනම් කිරීම නොකළ යුතුය.

යම් තැනැත්තකුට ලැබිය යුතු වන්දියක් තහනමට ගැනීම හෝ තහනම් කිරීම තහනම් බව.

**34.** මේ පනත යටතේ ගෙවිය යුතු යම් වන්දියකට යම් තැනැත්තකුට හිමිකම ඇති අවස්ථාවක සහ යම් පිළිගත් ණය නියෝජිත ආයතනයක් විසින් ඒ තැනැත්තාට දෙන ලද ණයක් සම්පූර්ණයෙන් හෝ ඉන් යම් කොටසක් ආපසු ගෙවීමෙහි ලා හෝ ඒ ණය වෙනුවෙන් යම් පොලියක් ගෙවීමෙහි ලා ඒ තැනැත්තාගෙන් ඒ ආයතනයට යම් මුදලක් අය විය යුතු බවට මණ්ඩලය සෑහීමට පත් වූ අවස්ථාවක ඒ පිළිගත් ණය නියෝජිත ආයතනයට අය විය යුතු මුදල ඒ වන්දි මුදලෙන් අඩු කර ඒ ආයතනය වෙත යැවීමට මණ්ඩලය විසින් සලස්වනු ලැබිය හැකිය.

වන්දියෙන් අඩු කිරීම.

රක්ෂණ ඔප්පුව අදාළ වන සම්බන්ධතාවක් පැවරීමේ බලපෑම.

35. යම් රක්ෂිත තැනැත්තකුගේ අයිතිවාසිකම, හිමිකම සහ සම්බන්ධතාව වෙන යම් තැනැත්තකු වෙත පවරනු ලැබූ විට පැවරුම්කරුගේ සියලු ම අයිතිවාසිකම්වලට පැවරුම්ලාභියා හිමිකම් ලබන්නේ ය. තවද පැවරීම කරනු ලැබූ දිනයේ සිට, පැවරුම්කරු විසින් ඉටු කරනු නොලැබ තිබෙන සියලු ම බැඳීම්වලට පැවරුම්ලාභියා යටත් වන්නේ ය.

රක්ෂණය අවලංගු කිරීම.

36. රක්ෂිත තැනැත්තා විසින්—

(අ) රක්ෂණයට සම්බන්ධ කිසියම් වැදගත් කරුණක් වසන් කරනු ලැබ ඇතහොත් හෝ වැරදි ලෙස දක්වනු ලැබ ඇතහොත් හෝ රක්ෂණය සම්බන්ධයෙන් යම් වංචාවක් කරනු ලැබ ඇතහොත්, හෝ

(ආ) ඒ ගිවිසුම පිළිබඳ යම් නියමයක් හෝ කොන්දේසියක් පිළිපැදීම පැහැර හරිනු ලැබුවහොත්

මේ පනත යටතේ වූ රක්ෂණ ගිවිසුම අවලංගු වූ බව මණ්ඩලය විසින් ප්‍රකාශ කරනු ලැබිය හැකි අතර ඒ ගිවිසුම සම්බන්ධයෙන් ගෙවන ලද වාරික, මණ්ඩලය විසින් අහිමි කරනු ලැබිය හැකිය.

ද්‍රව්‍යයෙන් වාරික ගෙවීම.

37. (1) මේ පනත යටතේ වූ රක්ෂණ ගිවිසුමක් යටතේ ගෙවන යම් වාරිකයක් මුදලින් හෝ ඒ ගිවිසුම අදාළ වන නිශ්චිත වගාවෙන් හෝ, නැතහොත්, කොටසක් මුදලින් ද කොටසක් ඒ නිශ්චිත වගාවෙන් ද, ගෙවිය යුතුය.

(2) අවශ්‍ය වන සෑම විට ම, නිශ්චිත වගාවලින් සමන්විත වන අරමුදලේ යම් කොටසක් මණ්ඩලය විසින් විකිණිය හැකි අතර විකිණීමෙන් ලැබෙන මුදල ඒ විකිණීම සම්බන්ධයෙන් වැය වූ වියදම් ඉන් අඩු කර ගෙන ඒ අරමුදලට බැර කළ යුතුය.

නිශ්චිත වගා වගා කරනු ලබන ඉඩම් පරීක්ෂා කිරීමට ඇති බලය.

38. (1) මණ්ඩලය විසින් හෝ පරීක්ෂා කිරීමට මණ්ඩලය විසින් බලය පවරනු ලබන යම් නිලධරයකු විසින් යම් නිශ්චිත වගාවක් තිබෙන හෝ යම් රක්ෂිත පශු සම්පත් ඇති යම් ඉඩමකට ඇතුළු වී එය පරීක්ෂා කිරීම හෝ ඊට සම්බන්ධ යම් ලේඛන පරීක්ෂා කිරීම් කළ හැකි අතර ඒ පරීක්ෂණයට ඉඩ දීම සහ සහාය දීම ඒ ඉඩම් පරිහරණය කරන සෑම තැනැත්තකුගේ ම යුතුකම වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියාකිරීම පැහැර හරින සෑම තැනැත්තෙක් ම වරදක් කරන්නේ ය. තවද මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේ ය.

රක්ෂිත ඉඩමකට හානි සිදුවීම වැළැක්වීමට පිය වර ගන්නා ලෙස රක්ෂිත තැනැත්තකුට විධාන කිරීමට ඇති බලය.

39. වගාවට හෝ පශු සම්පත්වලට සිදුවන හානි වැළැක්වීම සඳහා හෝ අඩු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පියවර ගන්නා ලෙස මණ්ඩලය විසින් හෝ තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් මේ පනත යටතේ රක්ෂිත තැනැත්තකුට හෝ රක්ෂණ ඔප්පු හිමියකුට විධාන කරනු ලැබිය හැකිය.

40. (1) 1961 අංක 13 දරන වගා රක්ෂණ පනත මෙයින් ඉවත් කරනු ලැබේ. 1961 අංක 13 දරන වගා රක්ෂණ පනත ඉවත් කිරීම.

(2) 1961 අංක 13 දරන වගා රක්ෂණ පනත ඉවත් කරනු ලැබූ නමුදු රක්ෂිත තැනැත්තන් විසින් වාරික ගෙවීම් වශයෙන් ඒ පනතේ විධිවිධාන යටතේ ගෙවිය යුතු වූ ද නොගෙවා ඇත්තා වූ ද සියලු ම බැඳීම් මේ පනත ආරම්භ වන දිනයෙහි මණ්ඩලයට ගෙවිය යුතු ලෙස සැලකිය යුතුය.

41. මේ පනතෙහි — අර්ථ නිරූපණය.

"පිළිගත් ණය නියෝජිත ආයතනය" යන්නෙන් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් මේ පනතේ කාර්ය යන් සඳහා පිළිගත් ණය නියෝජිත ආයතනයක් වශයෙන් මණ්ඩලය විසින් තත් කාලයෙහි ප්‍රකාශ කරනු ලැබ ඇති සමුපකාර සමිතියක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ ; තවද

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් ආධාර වශයෙන් හෝ ණයක් වශයෙන් හෝ වෙනත් ආකාරයකින් ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන් හෝ කොටසක් සපයන ලද ප්‍රාග්ධනයෙන් සමාගම් ආඥාපනත නොවන යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවනු ලබන යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් පුද්ගලී මණ්ඩලයක් අදහස් වේ.